# ටෙන්ඩර් කැඳවීම සඳහා දැන්වීමයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

## ශ්‍රී ලංකාවේ කෙරවලපිටිය වෙරළ ඔබ්බෙහි වැලි කැණීම, පොම්ප කිරීම සහ ගොඩගැසීමේ ව්‍යාපෘතිය

**ප්‍රසම්පාදන අංකය : S/534/25**

1. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ස්ථාවර ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු (SHLPC) සභාපතිවරයා විසින්, ශ්‍රී ලංකාවේ කෙරවලපිටිය වෙරළ ඔබ්බෙහි වැලි කැණීම, පොම්ප කිරීම සහ ගොඩගැසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම සඳහා සුදුසුකම්ලත් ටෙන්ඩර්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ.
2. ආසන්න වශයෙන් අක්වෙරළ වැලි කියුබික් මීටර් 2,300,000 ක් කැණීම් කළ යුතු අතර, එයින් වැලි කියුබික් මීටර් 300,000 ක් ඉඩම ගොඩකිරීම සඳහා සහ වැලි කියුබික් මීටර් 2,000,000 ක් වැලි සංචිත ගොඩගැසීම සඳහා භාවිතා කෙරේ. තවද, ගොඩකිරීම සහ/හෝ සංචිත ගොඩගැසීම සඳහා අතිරේක ප්‍රමාණයක් ලෙස වැලි කියුබික් මීටර් 1,000,000 දක්වා සේවායෝජකයාට ඉල්ලා සිටිය හැකි අතර, එය ප්‍රමාණ බිල් පත්‍රයේ දක්වා ඇති මිල අගයන් යටතේම කොන්ත්‍රාත්කරු විසින් ලබා දිය යුතුය.
3. වෙරළේ සිට කිලෝමීටර 10-16 ක් දුරින් පිහිටි වර්ග කිලෝමීටර 47 ක අක්වෙරළ වැලි නිධි ප්‍රදේශයෙන් වැලි කැණීම් කළ යුතු අතර, කෙරවලපිටිය පිහිටි හෙක්ටයාර 42 ක් වන ඉඩමට වැලි පොම්ප කිරීම සිදුකල යුතුය. පොම්ප කරන ලද වැලි හොඳින් ශ්‍රේණිගත විය යුතු අතර මධ්‍ය ප්‍රමාණයේ සිට රළු ප්‍රමාණය මිනුම් කරනු ලබන D50 අගය මිලිමීටර 0.5 සිට මිලිමීටර 1.2 දක්වා පරාසයක තිබිය යුතුය.
4. ව්‍යාපෘති කාලය දින 120 කි.
5. ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ (ICB) ක්‍රියාපටිපාටිය මඟින් ටෙන්ඩර් කැඳවීම සිදු කෙරේ.
6. වැඩ කරන දිනවල පෙ.ව. 09.30 සිට ප.ව. 03.30 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය වෙතින් උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන්ට වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය. දුරකථන: +94 112 871167 / +94 112 862203 / +94 71 455 7796. විද්‍යුත් තැපෑල : pbdsllrdc@gmail.com
7. ටෙන්ඩර්කරුවන්ට තිබිය යුතු මූලික සුදුසුකම් :

   2010 ජනවාරි සිට 2025 ජුනි දක්වා කාලය තුළ තනි ව්‍යාපෘතියක විෂය පථය ලෙස අවම වශයෙන් වැලි කියුබික් මීටර 1,500,000 ක්, අක්වෙරළ කැණීම් යන්ත්‍ර, බූස්ටර් පොම්ප සහ නල මාර්ග භාවිතයෙන් වෙරළේ සිට අවම වශයෙන් කිලෝමීටර 01 ක් ගොඩබිම ඇතුලත සිදු කල වැලි සංචිත ගොඩගැසීමේ හෝ ඉඩම් ගොඩකිරීමේ ව්‍යාපෘති අවම වශයෙන් 05 ක් සිදු කර තිබීම. සහ

   2005 ජනවාරි සිට 2025 ජුනි දක්වා කාලය තුළ තනි ව්‍යාපෘතියක විෂය පථය ලෙස අවම වශයෙන් කියුබික් මීටර් 1,000,000 ක් අක්වෙරළ වැලි සංචිත ගොඩගැසීම සඳහා වැලි කැණීම සහ පොම්ප කිරීමේ ව්‍යාපෘති අවම වශයෙන් 01 ක් සිදු කර තිබීම.

   ඉහත අවශ්‍යතා දෙකම සපුරාලීම සඳහා එකම ව්‍යාපෘතිය භාවිත කළ හැකිය.
8. සුදුසුකම්ලත් දේශීය සහ විදේශීය යන දෙපාර්ශවයේම ටෙන්ඩර්කරුවන් සමසේ සලකා ඇගයීම් කටයුතු සිදුකරනු ලැබේ.
9. 2025.12.09 සිට 2026.01.26 දක්වා පෙ.ව.09.30 සිට ප.ව.03.30 ඇතුලත කාලයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්), ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය ලිපිනයේදී ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කර මිලදී ගත හැකිය. ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන රු.250,000 ගාස්තුවක් ගෙවීමෙන් පසු අදාල මව් සමාගම නියෝජනය කරනු ලබන ටෙන්ඩර්කරුවන් සඳහා පමණක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. දුරකථන: +94 112 866832 / +94 71 869 4222 විද්‍යුත් තැපෑල : supplies@sllrdc.lk
10. පූර්ව ටෙන්ඩර් රැස්වීම 2025.12.30 දින පෙ.ව.10.30 ට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි රැස්වීම් ශාලාවේ දී පැවැත්වේ.
11. මුද්‍රා තැබූ ටෙන්ඩර්, 2026.02.06 දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර සභාපති, ස්ථාවර ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, පරිසර ආරක්ෂණ සහ තාක්ෂණික අංශය, 4 වන මහල, සෙත්සිරිපාය අදියර 1, බත්තරමුල්ල යන ලිපිනය වෙත භාර දිය යුතුය. 2026.02.06 ප.ව. 02.00 පසු වූ වහාම ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී එකී ටෙන්ඩර් විවෘත කිරීම සිදු කරනු ලැබේ.
12. සියළුම ටෙන්ඩර්කරුවන් විසින් 2026.10.09 දින දක්වා වලංගු වන ඇමරිකානු ඩොලර් 150,000 ක ටෙන්ඩර් සුරැකුමක් ටෙන්ඩර් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) වෙනුවෙන්
සභාපති, ස්ථාවර ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
පරිසර ආරක්ෂණ සහ තාක්ෂණික අංශය, 4 වන මහල, සෙත්සිරිපාය අදියර 1, බත්තරමුල්ල